Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව

විෂය - නර්තනය

සතිය- 2021-05 03- 2021-05-07

ශ්‍රේණිය 13

Prepared by-H.I.NeelaKanthi.

නිපුණතාව- - නර්තනය හා සබැඳි සිද්ධාන්ත අධ්‍යයනය කරමින් ප්‍රායෝගිකව භාවිතා කරයි .

නිපුණතා මට්ටම - 2.2 රංග භූමිය හා නූතන වේදිකාව පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි .

ක්‍රියාකාරකම රංග භූමිය හා නූතන වේදිකාව පිළිබඳ විමසමු .

<u>නිවැරදි පිළිතුර තෝරන්න.</u>

1.සජීවී ලෙස රංග කාර්යක් ප්‍රේක්ෂකයා වෙත ඉදිරිපත් කරන ස්ථානය 1.ප්‍රෙක්ෂකා ගාරය 2. වීදිය 3.මාවත 4. රංග භූමිය

2.නාට්‍ය මණ්ඩපය නාට්‍ය ගෘහය ඉදිකල ආකාරය සඳහන් වනනේ 1. නාට්‍ය ශාස්ත්‍රයේ 2.අභිනය දර්පනයේ 3.හෙළගී මග 4.ලෙන් ලිපි

3.වේදිකාවට රංගය යන නම භාවිත කර ඇත්තේ ------------------- කෘතියේය .

1. නාට්‍ය ශාස්ත්‍රයේ 2. අභිනය දර්පනයේ 3.හෙළ ගී මග 4 .ගැමි නාටක සංග්‍රහය

4.සොකරි නාටකයේ රග මඩල ----------------------- ලෙස හැඳින් වේ . 1 කමත 2. වීදිය 3. තානායම් පොළ 4. මඩුව

5. කෝලම් රග මඩල ---------------------- ලෙස හැඳින් වේ . 1 කමත 2. වීදිය 3. තානායම් පොළ 4. මඩුව

හිස් තැන් සඳහා නිවැරදි පිළිතුරු යොදන්න .

6. දේශිය ශාන්ති කර්ම රග දක්වන එළිමහන් භූමියේ ඉදි කරන ලද රග මඩල --------------- ලෙස හැඳින් වේ .

7.සන්නි යකුම් යාගයේදි තනන ලද රංග භූමිය සන්නි යකුන් --------------- ලෙස හැඳින් වේ .

8.කෝලම් නාටකයේ දි රග මඩලට අවතීර්ණ වීමට -------------------- යොදා ගනී .

9.ශාන්තිකර්ම රග මඩලෙහි ප්‍රෙක්ෂකයා සහ ශිල්පීන් වෙන් කරනුයේ මඩුව වටා ------------------- ඇදීමෙනි .

10.බෝදිලි තැඹිලි තල් පොල් මල් පුවක් වලු යන කවියෙන් කියවෙන්නේ --------------- ශාන්තිකර්මයේ මඩුව සකසන ආකාරයයි.

සියලුම ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.

11.රංග භූමිය යන වචනය පැහැදිළි කරන්න.

12.දේශීය ගැමි නාටක රංග භූමි පිළිබඳ වෙන වෙනම පැහැදිළි කරන්න .

13.දේශීය ශාන්තිකර්ම රංග භූමි පිළිබඳ හැඳින්වීමක් කරන්න .

14.රංග භූමි අලංකරණය සඳහා යොදා ගන්නා සැරසිළි වෙන වෙනම පැහැදිළි කරන්න .